## කොළඹ විශ්වවිද්‍යාලය - අධ්‍යාපන පීඨය
## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව(නාට්‍ය හා රංගකලාව) සති අන්ත

හැඳින්වීම

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨය මගින් දැනට අධ්‍යාපන සේවයේ නියුක්ත උපාධිධාරී ගුරුවරුන් සඳහා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (නාට්‍ය හා රංග කලාව) පාඨමාලාව පවත්වනු ලැබේ. සෞන්දර්ය විෂය ක්ෂේත්‍රයට අයත් ලලිත කලා හා ප්‍රසාංගික කලා උපාධිධාරී ගුරුවරුන් සඳහා මෙම පාඨමාලාව සුවිශේෂ වන අතර සෞන්දර්ය ක්ෂේත්‍රයේ හැකියාවක් ඇති ඒ සඳහා රුචිකත්වයක් ඇති අනෙකුත් උපාධිධාරී ගුරුවරුන් සඳහා ද ඒ සඳහා ඉල්ලුම් කළ හැකිය.

1. 1.1 පාඨමාලාව ඉල්ලුම් කිරීමට අවශ්‍ය මූලික සුදුසුකම් :
   - (i). පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියකු වීම.
   - (ii). 2015.12.31 දිනට වයස අවුරුදු 50ට වැඩි නොවීම.
   - (iii). දැනට ගුරු වෘත්තියේ නියැලීම හෝ අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ වෙනත් ආයතනයක හෝ අධ්‍යාපනයට සම්බන්ධ තනතුරක් දැරීම.

1.2 විශේෂ සුදුසුකම්
- (i) ලලිත කලා හා සෞන්දර්ය ක්ෂේත්‍රයේ උපාධියක් හිමි වීම.
- (ii) පාසල්වල නාට්‍ය හා රංගකලාව විෂයය ඉගැන්වීම.
- (iii) නාට්‍ය/රංග කලා/නර්තන/ගායන ආදී සෞන්දර්ය ක්ෂේත්‍රවල ප්‍රායෝගික අත්දැකීම් තිබීම.
- (iv) නාට්‍යකරණය/රංගනය පිළිබඳ වෙනත් පාඨමාලා හදාරා තිබීම.
- (v) අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල තනතුරුධාරීන්ටද ඉල්ලුම් කළ හැකිය.

2. ඉල්ලුම් කිරීම හා තෝරා ගැනීම
   - (i) මේ සඳහා සකසා ඇති ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කර එවන්න.
   - (ii) තෝරා ගැනීම සඳහා පවත්වන භාෂා හැකියාව හා අධ්‍යාපනය පිළිබඳ සාමාන්‍ය දැනීම අන්තර්ගත ලිඛිත විභාගයට හා සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීම අවශ්‍යය.
   - (iii) ලිඛිත විභාගයෙන් ඉහළ ලකුණු ලබා ගන්නා සිසුන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එම ලිඛිත විභාග ලකුණු හා සම්මුඛ පරීක්ෂණ ලකුණු පදනම් කරගෙන තෝරා ගැනීම සිදු කෙරේ.

3. පාඨමාලාවේ අරමුණු
   - (i) පාසල් ශිෂ්‍යයන් තුළ සෞන්දර්ය රසඥතාව නංවාලමින් ඉගැන්වීමට නිපුනතා ඇති සෞන්දර්ය ගුරුවරුන් පුහුණු කිරීම.
   - (ii) ක්ෂේත්‍රයෙහි උන්නතියට කටයුතු කළ හැකි, වඩාත් අර්ථවත් අත්දැකීම්, නවෝත්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කළ හැකි ගුරුවරයකු ක්ෂේත්‍රයට දායාද කිරීම.
   - (iii) සෞන්දර්ය ක්ෂේත්‍රයට අයත් ගුරුවරුන්ගේ වෘත්තිය නිපුනතාව නංවාලමින් අභිමානවත්, ධනාත්මක ගුරු පෞරුෂයකින් යුතු ප්‍රවීන අධ්‍යාපනඥයකු බිහිකර ලීම.
   - (iv) අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධව කටයුතු කරන තනතුරුධාරීන්ට ද සෞන්දර්ය ක්ෂේත්‍රයට අර්ථවත් දායකත්වයක් ලබාදීමට හැකි කුසලතා වර්ධනය කරලීම.

4. පාඨමාලාවේ අන්තර්ගතය

මෙම පාඨමාලාව සඳහා පහත දැක්වෙන විෂයයන් නිර්දේශිතය.

- (i) අධ්‍යාපනයේ දාර්ශනික හා සමාජ විද්‍යාත්මක පදනම
- (ii) අධ්‍යාපනයේ මනෝ විද්‍යාත්මක පදනම
- (iii) අධ්‍යාපන මිනුම් හා ඇගයුම්

(iv) ඉගැන්වීම් පුහුණුව ( පාසල් පුහුණුව)
(v) නාට්‍ය හා රංග කලාව ඉගැන්වීම් මුලධර්ම හා ක්‍රමශිල්ප
(vi) නාට්‍ය හා රංග කලාව පිළිබඳ මුලධර්ම
(vii) නාට්‍ය හා රංග කලා ඉතිහාසය
(viii) නාට්‍යකරණය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව
(ix) නිබන්ධය (කාර්යමුල පර්යේෂණය)

5. ප්‍රායෝගික පුහුණුව

(i) මෙම පාඨමාලාව න්‍යායාත්මක පදනම හා ප්‍රායෝගික අභ්‍යාස ඇතුළත් පාඨමාලාවකි.
(ii) ප්‍රායෝගික අභ්‍යාස පස්වරු කාලයේ පැවැත්වේ.
(iii) මෙම පාඨමාලාව හදාරන සෑම ශිෂ්‍යයකුම සති 10ක පාසල් පුහුණුවක් ලබා ගත යුතුවේ. මෙම ප්‍රායෝගික පුහුණුව අඛණ්ඩව සති 10ක් පාසල්වල පූර්ණකාලින වශයෙන් කළ යුතු නිසා ඒ සඳහා නිවාඩු ලබා ගත හැකි විය යුතුය.
(iv) පුහුණුව සඳහා කොළඹ විශ්වවිද්‍යාලයට සමීප පාසල් තෝරා ගත හැකිය. ඒ සඳහා පාසල් ලබාදීම පීඨය මගින් කරනු ලැබේ.

6. නිවාඩු ලබා ගැනීම

(i) පාඨමාලාව සෙනසුරාදා/ඉරිදා දිනවල පැවැත්වේ.
^ii). පාඨමාලාව හදාරන සිසුන්ට දැනට තමන් උගන්වන පාසලේ ම ගුරු පුහුණුව ලැබිය හැකිය. සිසුන්ගේ ගුරු පුහුණුව ඇගයීම සඳහා ප්‍රමුඛාචාර්යවරුන් සහ කථිකාචාර්ය මහතුන් විසින් විශේෂ ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක කෙරේ.
(iii). වෙනත් ක්ෂේත්‍රවල නියැලි තනතුරුධාරීන් තේරුනහොත් එම සති 10 ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීමට අදාලව නිවාඩුව ලබා ගත හැකි බව ලිඛිතව අනුමත කොට ලියාපදිංචි වන විටම ඉදිරිපත් කළ යුතු වේ.